# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/4 — 1970 සැප්තැම්බර් 16 වැනි බදාදා — 1970.9.16

ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ඊ. 1/70.

### ලංකා පරිපාලන සේවයේ V වැනි පංතියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය—1970

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුළත් කර ගැනීම පිණිස 1970 දෙසැම්බර් මාසයේ කොළඹදී පැවැත්වීමට නියමිත තරඟ විභාගය සඳහාවූ පහත සඳහන් රෙගුලාසි මාලාව, විභාග පරිපාටිය සහ නිර්දේශ පත්‍රිකාව මහජනයාගේ දැනගැනීම සඳහා පළකරනු ලැබේ. අංක 14,915 සහ 1970 ජුලි මස 17 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ, 1970 ජුලි මස 4 වැනි දින දරන මගේ නිවේදනයෙහි සඳහන් වූ රෙගුලාසි මාලාව, විභාග පරිපාටිය සහ නිර්දේශ පත්‍රිකාව මින් අවලංගු කරනු ලැබේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 500,
කොළඹ,
1970 සැප්තැම්බර් මස 11 දින දිය.

#### රෙගුලාසි මාලාව

1. ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට බඳවා ගැනීම පිණිස විවෘත තරඟ විභාගයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කොළඹදී පවත්වනු ඇත. මෙම විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ. ''ඒ'' කොටස—ඉවත් කිරීමේ පරීක්ෂණය—රචනා සහ අවබෝධය පිළිබඳ ප්‍රශ්න පත්‍ර අඩංගු මෙම කොටස 1970 දෙසැම්බර් මස හෝ ඊට නුදුරු දිනකදී පළමුව පවත්වනු ලැබේ. නියම දිනයන් පසුව දැනුම් දෙනු ලැබේ. ''බී'' කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණය—(සහ ලංකා විදේශ සේවයේ අපේක්ෂකයින් සඳහා වන ''සී'' කොටස) පවත්වනු ලබන්නේ, ''ඒ'' කොටසේ ප්‍රතිඵල ලැබීමෙන් පසුවය. ''බී'' සහ ''සී'' කොටස්වලට අදාළ පරීක්ෂණ පැවැත්වෙන දිනයන් පසුව දැනුම්දෙනු ලැබේ. පොදු යහපත පිණිස මෙම විභාගය අවලංගු කළ යුතුයැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් කරතොත් එසේ අවලංගු කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම විභාගය කල්දැමීම අවශ්‍ය යැයි අදහස් කළ විටක එසේ කල්දැමීමේ බලයද රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අයත් වේ.

2. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පුරවනු ලබන ලංකා පරිපාලන සේවයේ සහ ලංකා විදේශ සේවයේ ඇබෑර්තු සංඛ්‍යාවත්, එම ඇබෑර්තු පුරවනු ලබන දිනයත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යථාකාලයේදී තීරණය කරනු ඇත. තවද, පොදු යහපත පිණිස කළයුතුයැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකතොත් ඇබෑර්තු කිසිවක් හෝ සියල්ලම හෝ නොපුරවා හැරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3. මෙම විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සියලුදෙනාම ලාංකිකයන් විය යුතුය. මෙම විභාගයේ පරමාර්ථයන් සඳහා ලාංකිකයෙකු යන්නෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු වන කෙනෙකි.

4. මෙම විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයින් 1970 අගෝස්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 22 ලබා තිබිය යුතු අතර, වයස අවුරුදු 30 ලබා නොතිබිය යුතුය. පූර්වෝක්ත වයස් සීමාවන් රජයේ සේවයෙහි, රජයේ සංස්ථා සේවයෙහි සහ පළාත් පාලන සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන්ට අදාල වන්නේ නැත.

5. නියම කරන ලද සුදුසුකම් හිමි අපේක්ෂිකාවන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුස්සන් වන අතර, පුරවනු ලබන ඇබෑර්තු වලින් සියයට 20 කට වැඩි ප්‍රමාණයක් ඔවුන් පත් කිරීමෙන් පුරවනු නොලැබෙනු ඇත.

6. විභාගයට පෙනී සිටීම සඳහා අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතුය. අනුමැතිය දීම සලකා බලනු ලබන්නේ අයදුම්පත ලැබීමෙන් පසුව පමණි.

7. තමන් සෞඛ්‍ය තත්ත්වයෙන් හා චරිත ශුද්ධියෙන් යෝග්‍යයයන් බව අපේක්ෂකයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තෘප්තියට හේතුවන පරිදි දක්විය යුතුය. තවද, ඔවුහු මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයෙන් හා හොඳට ඇස් පෙනීමෙන්ද දිවයිනේ කවර ප්‍රදේශයක වුවත් සේවය කිරීමට යෝග්‍ය කාය බලයකින්ද යුක්ත විය යුත්තෝය. විභාගයෙන් සමත්වන අපේක්ෂකයින්ට තමන් මෙකී කරුණු අතින් යෝග්‍යයන්දැයි පරීක්ෂා කර බැලීම සඳහා පැවැත්වෙන දැඩි සෞඛ්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ඇත.

8. විවාහක අපේක්ෂකයෙක්/අපේක්ෂිකාවක් වේ නම් ඔහු/ඇ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය නොමැතිව පත්වීමක් දෙනු ලැබීමට යෝග්‍ය නොවේ.

14. හැඳුනුම් පත්.—අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයයන් සඳහා විභාග ශාලාවේදී පරිපාලකගේ තෘප්තියට හේතුවන පරිදි තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. ඒ සඳහා පහත සඳහන් කවරක් හෝ පිළිගනු ඇත :—

(අ) පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් ;

(ආ) මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද වලංගු ගමන් ප්‍රවේශ පත්‍රයක් ;

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරය පිට මේ විභාගයට තුන් අවුරුද්දකට නොවැඩි කාලයකට පෙර නිකුත් කරන ලද දරන්නාගේ ඡායාරූපය අඩංගු කිසියම් සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන් කිසි ලියවිල්ලක්.

15. වැරදි තොරතුරු සැපයීම් පිළිබඳ දඬුවම.—මෙ විභාගයට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙක් ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර, විභාගය පැවැත්වෙන අතර හා ඊට පසු යන කවර අවස්ථාවකදී වුව ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු කිසිවක් ඔහුගේ දැනුම පරිදි වැරදි බව පෙනී යන ලද නම් හෝ ඔහු විසින් ස්වධ්‍යාශයෙන්ම කිසියම් වැදගත් කාරණයක් වසන කරන ලද නම් හෝ ඔහු රජයේ සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

16. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි ආරම්භයේ පළ කොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසි කෙරෙහි ඉල්ලුම්කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

## ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට සහ ලංකා විදේශ සේවයට ඇතුලත් කර ගැනීමේ විවෘත තරඟ විභාගය

### විභාග පරිපාටිය

මාධ්‍යය—මෙම තරඟ විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

(I) අපේක්ෂකයින් මෙම විභාගයට පෙනී සිටිය යුත්තේ, ඔවුන් සුදුසුකම් ලැබීමේ විභාගය සමත්වූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවෙනි.

(II) සුදුසුකම් ලැබීමේ විභාගයේ විවිධ විෂයයන්, එක් භාෂා මාධ්‍යයකට වැඩි භාෂා මාධ්‍ය ගණනකින් සමත්වී ඇති අපේක්ෂකයින්, මෙම විභාගයට පෙනී සිටිය යුත්තේ සුදුසුකම් ලැබීමේ විභාගයේදී, විෂයයන් වැඩි ගණනක් සමත්වී ඇති භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවෙනි.

(III) ප්‍රධාන විෂය එක් භාෂා මාධ්‍යයකිනුත්, අතිරේක විෂය තවත් භාෂා මාධ්‍යයකිනුත්, සමත්වී විශේෂ උපාධි ලැබ ඇති අපේක්ෂකයින් මෙම විභාගයට පෙනී සිටිය යුත්තේ, ඔවුන් තම ප්‍රධාන විෂය සමත්වූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවෙනි.

සටහන.—(1) ඉහත (i) සහ (ii)හි " සුදුසුකම් ලැබීමේ විභාගය" යන්නෙන් අදහස් කරනුයේ මෙම රෙගුලාසිවල 10 (අ) ඡේදයෙහි සඳහන් විභාගයයි.

සටහන.—(2) එකම භාෂා මාධ්‍යයකින් පමණක් සියලුම ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයින් විසින් පෙනී සිටිය යුතුය.

සටහන.—(3) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයින්ට අවසර දෙනු නොලැබේ.

විෂයයන්—මෙම විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වෙයි :—

"ඒ" කොටස—ඉවත් කිරීමේ පරීක්ෂණය—සියලුම අපේක්ෂකයින් සඳහා අනිවාර්ය වේ

(1) රචනා—ප්‍රශ්න පත්‍ර එකයි.

(2) අවබෝධය—ප්‍රශ්න පත්‍ර එකයි.

"බී" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණයට (සහ ලංකා විදේශ සේවය සඳහා වූ අයදුම්කරුවන් සම්බන්ධයෙන් වන "සී" කොටසට) පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා අපේක්ෂකයින් විසින්, "ඒ" කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් සියයට 65 ක ලකුණු තත්ත්වයක් ලබාගත යුතුවේ.

"බී" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණය

| | | |
|---|---|---|
| පොදු ප්‍රශ්න පත්‍රය | ... | ලකුණු 150 |
| බුද්ධි පරීක්ෂණය | ... | ලකුණු 150 |
| වාචික පරීක්ෂණ (සාමාන්‍ය) | ... | ලකුණු 200 |

"සී" කොටස—ලංකා විදේශ සේවය සඳහා වූ අපේක්ෂකයින්ට අනිවාර්ය වේ

| | | |
|---|---|---|
| ලෝක විත්ති | ... | ලකුණු 100 |
| වාචික පරීක්ෂණය (විශේෂ) | ... | ලකුණු 150 |

විභාගය පවත්වන පිළිවෙල.—මෙම විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ. "ඒ" කොටස—ඉවත් කිරීමේ පරීක්ෂණය—රචනා පිළිබඳ ප්‍රශ්න පත්‍රයකිනුත්, අවබෝධය පිළිබඳ ප්‍රශ්න පත්‍රයකිනුත්, සමන්විත වන අතර, එය පළමුව පවත්වනු ලැබේ. "ඒ" කොටසේ ප්‍රශ්න පත්‍ර දෙකින්, එක් එක් ප්‍රශ්න පත්‍රයට සියයට 65 ක ලකුණු තත්ත්වයක් ලබන අපේක්ෂකයෝ "බී" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණයට (සහ ලංකා විදේශ සේවය සඳහා වූ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වන "සී" කොටසට) පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

"බී" කොටස.—තෝරාගනු ලැබීමේ පරීක්ෂණය.—පොදු ප්‍රශ්න පත්‍රයකින්ද, බුද්ධි පරීක්ෂණයකින්ද, වාචික පරීක්ෂණ (සාමාන්‍ය) දෙකකින්ද සමන්විත වේ. ලංකා විදේශ සේවය සඳහා ඇතුළත්වන අපේක්ෂකයින්ට, වාචික පරීක්ෂණ (සාමාන්‍ය) දෙක ඇතුළු "බී" කොටසේ විෂයයන්ට අමතරව ලෝක විත්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයටද පෙනී සිටීමට නියම කරනු ලැබේ. ලෝක විත්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන, ප්‍රමාණවත් උසස් තත්ත්වයක් ලබාගන්නා අපේක්ෂකයින් පමණක්, වාචික පරීක්ෂණය (විශේෂ) සඳහා කැඳවනු ලැබේ.

ලංකා පරිපාලන සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබීමේ පිළිවෙල

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියට පත්කිරීම සඳහා අවසාන තේරීම කරනු ලබන්නේ, විභාගයේ "බී" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණයෙන්, වැඩිම මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින් අතුරෙනි.

ලංකා විදේශ සේවයට පත්කිරීම සඳහා තෝරාගනු ලැබීමේ පිළිවෙල

ලංකා විදේශ සේවයට පත් කිරීම සඳහා අවසාන තේරීම කරනු ලබන්නේ "බී" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණය—සහ "සී" කොටස සඳහා වූ මුළු ලකුණු වලින් වැඩිම එකතුව ලබාගත් අපේක්ෂකයින් අතුරෙනි.

### නිර්දේශ පත්‍රිකාව

විශේෂයෙන් සඳහන් කොට නැතිනම් මිස, සෑම ප්‍රශ්න පත්‍රයකටම නියමිත කාලසීමාව පැය තුනකි.

"ඒ" කොටස—ඉවත් කිරීමේ පරීක්ෂණය—සියලුම අපේක්ෂකයින් සඳහා අනිවාර්ය වේ

රචනා — විෂයයන් පෙළකින් තෝරාගනු ලබන විෂයයන් තුනක් පිළිබඳව කෙටි රචනා තුනක් අපේක්ෂකයින් විසින් ලියනු ලැබීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පත්‍රයකි. විශේෂ උගෙනීම් ක්ෂේත්‍රයකට මෙ රචනා විෂයයන් සම්බන්ධිත නොවන අතර, ඒ සම්බන්ධිත වනුයේ අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනීම හා ඥානය ප්‍රකාශ කිරීමට හා සිතීමට ඇති හැකියාව පරීක්ෂණයට භාජනය කරනු සඳහාය. වාක්‍ය රචනාවල තත්ත්වය විසඳනවා ඇත්තේ තමා තෝරාගත් මාතෘකා පැහැදිලි කිරීමේදී අනුගමනය කරන කල්පනා ශක්තිය හා නිවහල් භාවය අනුව මෙන්ම ඒවා ඉදිරිපත් කිරීම අනුවය. මේවා පැහැදිලිව මෙන්ම කියවිය හැකිසේ ලිවිය යුතුය.

..වබෝධය — විනාඩි 75 ක කාලයකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රයට කෙටි පාඨ ගණනාවක් අපේක්ෂකයින් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨයන් සම්බන්ධයෙන්, අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් ගණනාවක් ඉදිරිපත් කරනු ලබන අතර, ඉන් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැලපෙයි. අපේක්ෂකයින් විසින් මින් වඩාත්ම උචිත ප්‍රකාශය තෝරාගත යුතුවේ. අනෙක් පාඨයන් සම්බන්ධයෙන්, ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨයන්ගේ අර්ථය වටහා ගැනීමට හැකිවන අන්දම පරීක්ෂා කිරීමටය.

"ආ" කොටස—තෝරාගනු ලැබීමේ පරීක්ෂණය

පොදු ප්‍රශ්න පත්‍රය ... අයදුම්කරු වාසය කරන්නාවූත්, ඔහු සේවය කරන්නාවූත්, පරිසරය පිළිබඳව ඔහුගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ, පොදු ප්‍රශ්න පත්‍රයකි. මෙම පරිසරය වූකලී ලංකාවේ දේශපාලන, සමාජ, සංස්කෘතික හා ආර්ථික පරිසරයද, ජාත්‍යන්තර දේශපාලන පරිසරයද, විද්‍යාත්මක හා කාර්මික පරිසරයද වේ. ප්‍රශ්න කිපයකින් තම තමන් කැමති ප්‍රශ්න තෝරා ගැනීමට අවසර ඇත.

බුද්ධි පරීක්ෂණය ... විනාඩි 60 ක කාලයකට සීමාවන මෙය සකස්කර ඇත්තේ අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයත්, ඔහුගේ සිතෙහි වූ විශ්ලේෂක තත්ත්වයත් විනිශ්චය කිරීම සඳහාය. මෙම ප්‍රශ්න පත්‍රය ''බහු වර්ණ ක්‍රමය'' වශයෙන් හැඳින්වෙන වර්ගයේ ප්‍රශ්නවලින් යුක්තවනු ඇත.

වාචික පරීක්ෂණ ... (සාමාන්‍ය) වාචික පරීක්ෂණ පවත්වනු ලබන්නේ වෙන් වෙන් වශයෙන් වූ මණ්ඩල දෙකක් විසින් අනුක්‍රමික වශයෙනි. එක් එක් මණ්ඩලය අයදුම්කරුවකු සමඟ සාමාන්‍යයෙන් විනාඩි 15 ටත්, 20 ටත් අතර වේලාවක් ගත කරනු ඇත. එක් එක් මණ්ඩලය වෙන් වෙන් වශ වශයෙන් මුළු ලකුණු 100 කින් අයදුම්කරුට ලකුණු දෙනු ඇත. මෙම වාචික පරීක්ෂණ දෙකේ එක් අරමුණක් වනුයේ නායකත්වය දැරීම පිළිබඳව අයදුම්කරුවන් තුළ ඇති හැකියාව මැනීමයි.

"ඇ" කොටස—ලංකා විදේශ සේවය සඳහා වූ අපේක්ෂකයින්ට අනිවාර්යය

ලෝක විත්ති ... වත්මන් ලෝකය පිළිබඳව විශේෂ අවධානයෙන් යුතුව, ලෝක විත්ති පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා පිළියෙලවූ පැය දෙකක කාලයකට නියමිත ලිඛිත ප්‍රශ්න පත්‍රයකි.

වාචික පරීක්ෂණය... (විශේෂ) පෞද්ගලික ගුණාංගයන් සහ විදේශ රටවල්, ජාත්‍යන්තර කටයුතු, ජාත්‍යන්තර නීති සහ විදේශ භාෂාවන් පිළිබඳ විශේෂ දැනීමද, සැලකිල්ලට ගෙන විදේශ සේවය සඳහා අපේක්ෂකයින්ගේ යෝග්‍යතාවය දැනගැනීම සඳහා පවත්වන මෙය සාමාන්‍ය වාචික පරීක්ෂණයට අමතර වශයෙනි.

සටහන.—අපේක්ෂකයින් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු වාචික පරීක්ෂණ පවත්වන මණ්ඩලවලට දෙනු නොලැබේ.

3-893

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී